# කුරුළු පැටවා



කාව්‍යා ඔනෙලි එදිරිසිංහ

| | | |
|---|---|---|
| කෘතියේ නම | - | කුරුළු පැටවා |
| ප්‍රථම මුද්‍රණය | - | 2023.11.15 |
| කතාව සහ චිත්‍ර | - | කාව්‍යා ඔනෙලි එදිරිසිංහ |
| කතෘගේ ලිපිනය | - | අංක: 86/13,<br>මාපනාවතුර පැසේජ්,<br>මහනුවර. |
| පාසල | - | මහාමායා බාලිකා විදුහල |
| ශ්‍රේණිය | - | 2 ශ්‍රේණිය C |

පරිගණක අක්ෂර හා පිටු සැකසුම : චම්පා ස්ටෝර්ස්
අංක: 51,
කොටුගොඩැල්ල වීදිය,
මහනුවර.

# පිදුම

මා හට සිප් සතර කියාදෙමින් නිතර
ඔවදන් ගුරුහරුකම් දෙන දයාබර
රේණුකා රාජපක්ෂ ගුරු මෑණියන්
වෙත මේ පොත සාදරයෙන් පිළිගන්වමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ එළඳායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරිමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂි ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

**2023** සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම් ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය-මහනුවර.
**2023.11.01**




ඔන්න එකමත් එක කාලෙක කුරුලු අම්මෙකුයි තාත්තෙකුයි හිටියා. කුරුලු අම්මා ලොකු බිත්තරයක් දැම්මා.

ඔන්න එක දවසක් බිත්තරේ පිපුරුණා. චුටිම චුටි කුරුලු පැටියෙක් එළියට ආවා.

අම්මා පැටියට පළතුරු කැවුවා. පැටියාට කවලා අම්මා ඉගිළිලා ගියා.

කුරුළු පැටියා නිදා ගත්තා. අම්මා ආවා.

කුරුළු පැටියා ඇහැරුණා. කුරුළු පැටියා ටික ටික ලොකු වුණා.



කුරුලු පැටියා ටිකෙන් ටික පියාඹන්න ඉගෙන ගත්තා. ඔන්න එක දවසක් විහිලු කරන්න කුරුලු අයියලා ටිකක් එතනට ආවා.

කුරුලු අයියලා කුරුලු පැටියාට විහිලු කරේ පියාඹන්න බෑ කියලා.

ඔන්න එක දවසක් කුරුලු පැටියා පියාඹන්න පටන් ගත්තා.

කුරුලු පැටියා පියාඹන්න කූඩුවෙන් එළියට ආවා. හරියට පියාඹන්න බැරි නිසා බිමට වැටුණා. අම්මා ආවා.

අම්මා පැටියාව උස්සලා කූඩුවෙන් තිබ්බා.

අම්මා පැටියාගේ කකුලට බෙහෙත් දැම්මා.

කුරුළු පැටියා කූඩුවේ හිටියේ කකුල සනීප වෙනකල්.

කුරුළු පැටියා දැන් ලොකු වෙලා.






කුරුලු පැටියාගේ කකුල සනීප වෙලා තියෙන්නේ. දැන් කුරුලු පැටියාට පියාඹන්න පුළුවන්.

කෑම සොයන්නත් පුළුවන්. දැන් එයා ගොඩාක් ලොකුයි. එයාගේ අම්මත් නැහැ.

කුරුලු පැටියා දැන් තනියම කෑම සොයාගෙන කනවා. ඒ නිසා එයා හරි සතුටින් ඉන්නේ.

කුරුලු පැටියා දැන් අම්මා කෙනෙක් වෙලා.

කුරුලු අම්මා කූඩුවක් හදාගත්තා.



කුරුලු අම්මා ලොකු බිත්තරයක් දැම්මා. කුරුලු අම්මා බිත්තරේ පිහාටු වලින් වහගෙන හිටියේ.

එක දවසක් බිත්තරේ පිපුරුණා.



චුට්ටිම චූටි කුරුළු පැටියෙක් එළියට ආවා. අම්මා කුරුළු පැටියට පළතුරු කැවුවා.

කුරුළු පැටියා රස කර කර කෑවා.

අම්මාට හරි සතුටුයි. පැටියාටත් හරි සතුටුයි.

අම්මා උදේට කෑම සොයන්න යන නිසා කුරුළු පැටියාට පාළුයි.

කුරුළු පැටියා ළඟ තනියට සමනල්ලු මී මැස්සෝ රෑං කියලා පියාඹලා යනකොට එයාට පාළුයි.

ඒ නිසා එයාට දුකයි.

එක දවසක් එක කුරුල්ලෙක් කුරුලු පැටියාට විහිලු කරා.

කුරුලු පැටියාට පියාඹන්න බෑ කියලා.

කුරුලු පැටියා අම්මාට නෝක්කාඩු කිවුවා. ඕවා අහන්න එපා අම්මා කීවා.


එක දවසක් කුරුලු පැටවා කූඩුවෙන් එළියට ආවා.

ඔන්න අද මම පියාඹනවා.

කුරුලු පැටියා පියාඹනවා. ඒත් හුලං කපාගෙන යන්න බැහැ.

කුරුලු පැටියා බිමට වැටුණා.


කුරුලු අම්මා ආවා.



කුරුළු අම්මා පැටියාව උස්සලා කූඩුවෙන් තිබ්බා. අම්මා පැටියාගේ කකුලේ බෙහෙත් ගෑවා.

කකුල සනීප වෙන කල් ඉන්න වුණා.

කුරුළු පැටියා ලොකු වෙලා ඊත් කුරුළු පැටියාගේ කකුල සනීප වෙලා නැහැ.



දැන් කුරුලු පැටියා ලොකු වෙලා.
කකුල ටිකක් සනීප වෙලා තියෙන්නේ.
කුරුලු පැටියා එයා ගැනම හිතුවා.
එයාටම එයා ගැන දුක හිතුණා.
ඒත් එයා සතුටින් හිටියා.

කාව්‍යා ඔනෙලි එදිරිසිංහ
2 ශ්‍රේණිය C
මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතු කොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියා මුලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යාන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට
යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.11.01

ISBN 978-624-206-787-2
9 786242 067872